# සිගිතිගේ මල්වත්ත



රිසිදි දිහාසා ගුණරත්න

# සිඟිතිගේ මල්වත්ත

රිසිඳි දිහාසා ගුණරත්න

සිඟිතිගේ මල්වත්ත

© රිසිදි දිහාසා ගුණරත්න
මහාමායා බාලිකා විදුහල
6 ශ්‍රේණිය G
2025.02.08

ISBN 978 - 624 - 208 -772-6

## පිදුම

*මා හට අකුරු කියාදී*

*යහමග පෙන්වූ*

*ගුරු මෑණිවරුන්ට සහ ගුරු පියවරුන්ට*

*ආදරයෙන්*

*පුදමි.*

# පෙරවදන


සාහිත්‍යය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපීපෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහාමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්ත කර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කරගැනිමට අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදි කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛක සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථ කරණයට යොමු කරන "හෙරණගත්කරණි" ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය.

මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. පිවිතයේ මුල් අවධියේම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛන කරණයට යොමුවීමේ ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,
ශශිකලා සේනාධීර,
මහාමායා බාලිකා විද්‍යාලය මහනුවර.

එකමත් එක රටක ලස්සන ගැහැණු ළමයෙක් හිටියා. එයාගේ නම සිඟිති. සිඟිති,අම්මයි,තාත්තයි එක්ක සතුටින් ජීවත් වුණා.



සිඟිති හරිම ආසයි මල් වවන්න. සිඟිති මුලු විවේක කාලයම ගත කළේ මල් වවන්න සහ මල් ගැන ඉගෙන ගන්න.



සිඟිතිගේ ගෙවත්ත හරිම ලස්සනයි.එක එක ජාතියේ පාට පාට මල් පිරිලා. සිඟිතිගේ මල් වත්තේ වැඩිපුරම තිබුණේ රෝස මල්.



රෝස මල් වල සුවඳට පාට පාට සමනලයෝ,මී මැස්සෝ,කුරුල්ලෝ ගොඩක් ආවා. මේ අය තමයි සිඟිතිගේ යාලුවෝ වුණේ. එයාලා හරිම ලස්සනයි.



සිඟිති උදේම නැගිටලා පාසල් යන්නට පෙර මල් පාත්තිය ළඟට යනවා. සිඟිති ගුරුතුමියට රෝසමල් පොකුරක් අරගෙන යන්න නම් අමතක කළේ නෑ.



ටික දවසක් යනකොට මල් පාත්තියේ මල් පිපෙන එකත් ටිකෙන් ටික අඩු වුණා. සිඟිතිට හොඳටම දුකයි. සිඟිති හොඳටම ඇඩුවා. වළාකුළු යාළුවෝ මේ දිහා බලාගෙන හිටියා. එයාලට හොඳටම දුකයි.



සුදු වලාකුළු, කළු වලාකුළුවලට කතාකරා අනේ අර බලන්න සිඟිති හොඳටම අඩනවා. එයාගේ මල් ගස්වල මල් පිපෙන්නෙත් නෑ. කළු වලාකුළු සිඟිතිගේ මල් වත්ත දිහා බැලුවා. පාට පාට ලස්සන මල් දකින්නට ලැබුණෙත් නෑ.





වළාකුළු වලට හොඳටම දුකයි. කළු වලාකුළු ලොකු වැස්සක් ලබා දුන්නා. මැලවෙලා තිබුණු රෝස පැළවලට පණ ආවා ආයෙමත් රෝස මල් පිපෙන්න පටන් ගත්තා. සිඟිතිට හරිම සතුටුයි.



සිඟිත්ට සතුටින් ඉන්න උදවු කළ නිසා මී මැස්සෝ,කුරුල්ලෝ,සමනලයෝ හැමෝම වළාකුළු වලට ස්තූති කළා.



ඒවා පස්සේ මෙයාලා වළාකුළු යාළුවෝවත් සෙල්ලම් කරන්න ගත්තා. ඊට පස්සේ මෙයාලා සතුටින් ජීවත් වුණා.



## පසුවදන

රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මණ කරණය විභවතා කොටගත් අනාගත පරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගිම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටත් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථ කරණයට යොමු කරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට අවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායිතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහිදී මහාමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පති තුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදි ශිෂ්‍යාවන් දැක්වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය.

මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය.

මානව දැනුම ගබඩා කර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමඟ දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මක බවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මක ව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනා කර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක ෂණය සමග ගළපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහාමායා බාලිකාවයන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ තම නිසඟ, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,<br>
සෙනෙවිරත්න මහලේකම්